# දූෂණ තොරතුරු හෙළිකරන්නන් හෙවත් අකටයුතු නාදකයින් උනන්දු කරවීම සහ ඔවුන්ගේ ආරක්ෂාව සඳහා වන පොදු ප්‍රතිපත්ති මාලාව

## හැඳින්වීම

රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, පළාත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හෝ පෞද්ගලික ආයතන යන සෑම අංශයකම ආයතන සඳහා, එම ආයතන තුළ දූෂණ හා අක්‍රමිකතාවන් පිළිබඳ තොරතුරු හෙළිකරන්නන් හෙවත් අකටයුතු නාදකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් ප්‍රතිපත්තියක් සකසා ගැනීම එම ආයතනයේ අභිවෘද්ධිය යථා පැවැත්ම සඳහාද මහජන යහපත සඳහාද ඉතාම වැදගත් වේ. දූෂණ තොරතුරු හෙළිකිරීමේ ශක්තිමත් ක්‍රමවේදයක් මගින් ආයතන තුළ සිදුවන බරපතල නීති විරෝධී හෝ දැඩි අවදානම් ක්‍රියාවන් සෘජුවම එහි අධ්‍යක්ෂක මණ්ඩල හෝ පාලක නිලධාරීන් වෙතට ලබා දීමට සේවකයින් දිරිගැන්වීම සිදු වන අතර ආයතන තුළ සිදුවන  දූෂණ වාර්තා කිරීමේ ශක්තිමත් ක්‍රමවේදයක් නොමැති විට පාලක ප්‍රධානින් හෝ භාරකාර මණ්ඩලයන් විසින් සිදුකරන ආයතනික දුර්වලතා සොයා බැලීම් සහ ඊට යොදනු ලබන පිළියම් ප්‍රතිඵලදායී නොවනු ඇත.

යම් ආයතනයක සේවකයින් හෝ කුමන ආකාරයකින් හෝ එයට සම්බන්ධව සිටින පුද්ගලයින් විසින් වෙනත් කිසිදු ආකාරයකින් පොදු ජනතාවට විවෘත නොමැති නීති විරෝධී හෝ කුමන ආකාරයක හෝ චර්යාධර්ම විරෝධී ක්‍රියාවක් පිළිබඳ තොරතුරක් හෝ මහජන පොදු යහපතට හානිකර කටයුත්තක් හෝ හෙළිකිරීම අකටයුතු නාදනය හෙවත් දූෂණ හා අක්‍රමිකතාවන් තොරතුරු හෙළිකිරීම ලෙස මෙහිදී අදහස් කරන අතර එය දූෂණය අවම කිරීමෙහිලා ඵලදායී පියවර ගැනීමට මහත් සේ දායක වනු ඇත.

රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පළාත් රාජ්‍ය, රාජ්‍ය නොවන අංශ හෝ පෞද්ගලික අංශය යන කුමන අංශයක දූෂණයක් වුවද ඉන් සෘජුවම මහජන යහපතට අගතිදායක බලපෑමක් ඇති වන අතර එය වැලැක්වීමෙහිලා කටයුතු කිරීම රාජ්‍යක පරම වගකීම ද සමස්ත සමාජයේ යුතුකමද වන්නේය. එහිදී අකටයුතුනාදනය සුවිශේෂ වැදගත් කමක් දරන අතර ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම රාජ්‍ය වගකීමක් වන්නේය.

## පූර්විකාව

අල්ලස හා දූෂණය වැලැක්වීම පසුගිය දශක තුනක පමණ කාලය පුරා ප්‍රධාන මාතෘකාවක් බවට පත් වී තිබුණද එය තවදුරටත් බරපතල ලෙස ආර්ථික දේශපාලන හා සමාජ සංවර්ධනය කෙරෙහි ප්‍රධාන බාධකය ලෙස පවතින බව සැලකිල්ලට ගනිමින්,

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් දක්වන හය වන පරිච්ඡේදයේ 28 වන ව්‍යවස්ථාව මගින් පොදු දේපල සුරක්ෂිත කොට ආරක්ෂා කිරීමද පොදු දේපල අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට හා නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීමට ජනතාවට ඇති යුතුකම මූලිකව පිළිගෙන ඇති බවට අවධාරණය කරමින්,

අල්ලස හා දූෂණය තවදුරටත් රාජ්‍ය අංශයට පමණක් සීමා වූවක් නොව රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික යන සියලු අංශකරා පැතිරෙමින් මහජන පොදු යහපත හා ආරක්ෂාව ද මූලික මිනිස් අයිතිවාසිකම් හා මානව ගරුත්වය ද අතිශය දුර්වල තත්ත්වයකට පත්කරමින් සිටින බව අවධාරණය කරමින්,

අල්ලස හා දූෂණය මැඩපැවැත්වීම සඳහා වර්ෂ 1954 අල්ලස් පනත හඳුන්වාදීම, 1956 වර්ෂයේදී පත් කළ තල්ගොඩපිටිය කොමිසම, 1994 දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවීම, එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතිය අපරානුමත කිරීම, 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය හා වර්ෂ 2015 දී මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය පිහිටුවීම, වැනි හුදකලා උත්සාහයන් ගණනාවක් ගනු ලැබුවද ඒවා එකිනෙක සම්බන්ධ කිරීමට අවශ්‍ය වන්නාවූ හා ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය වන්නාවූ නිසි යටිතල පහසුකම් සැපයීමක් හා උනන්දු කරවීමක් සිදු වී නොමැති බව පෙන්වා දෙමින්,

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරනු ලැබුවද මේ දක්වා ඒ මගින් සිදුකිරීමට බැඳී සිටින දූෂණ තොරතුරු වාර්තාකරනන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ආ යුතු නීතිමය ප්‍රතිපාදන, රාජ්‍ය නිලධාරීන් බලය අවභාවිතා කිරීමට එරෙහි නීතිමය ප්‍රතිපාදන සහ පෞද්ගලික අංශයද ඇතුලත් වන පරිදි අල්ලස හා දූෂණය සම්බන්ධ නීති යථාවත් කිරීම සිදුවී නොමැති බව අවධාරනය කරමින්,

අල්ලස හා දූෂණයට එරෙහිව ඇති ප්‍රධාන නීතිය වන අල්ලස් පනත මගින් අකටයුතුනාදකයින් සඳහා ප්‍රකාශිත ආරක්ෂාවක් ලබා දී නොමැති බව සහ මෙරට රාජ්‍ය පරිපාලනයේ විනය හා විධිමත් බව ආරක්ෂා කිරීමෙහිලා ප්‍රධාන දායකත්වය ලබා දෙන මූලික රීති පද්ධතිය වන ආයතන සංග්‍රහයේ සමහර ප්‍රතිපාදන මගින් සහ පුවත්පත් මණ්ඩල පනතේ ප්‍රතිපාදන මගින් දූෂණය පිළිබඳ තොරතුරු හෙළිකරන්නන් දැඩි පසුබෑමකට සහ අවධානම් තත්ත්වයකට පත් කරන බව පෙන්වා දෙමින්,

කෙසේ වුවද, වර්ෂ 2015 හඳුන්වා දෙනු ලැබූ අංක 04 දරන සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත හා 2016 අංක ______ දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතෙන් දූෂණ තොරතුරු හෙළිකරන්නන්හට වක්‍රාකාරව ලැබෙන අවම ආරක්ෂාව පිළිබඳවද ප්‍රසාදය පළකරමින්,

දැනට සැකසෙමින් පවතින විගණන පනත ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා අකටයුතුනාදකයින් ආරක්ෂාව අත්‍යාවශ්‍ය කරුණක් ලෙස පිළිගනිමින් ඊට අවශ්‍ය ප්‍රතිපාදන ඇතුලත් වීමේ සුවිශේෂත්වය අවධාරණය කරමින්,

තවදුරටත් රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හෝ පෞද්ගලික ආයතන තුළ සිටම එම ආයතනයන්ගේ හෝ මහජනතාවගෙත් අයහපත පිණිස හේතුවන දූෂණ හා අක්‍රමිකතාවන් පිළිබඳ තොරතුරු හෙළිකරන්නන් දිරිගැන්වීමත් ඔවුන්ගේ ආරක්ෂාවත් පිණිස,

දූෂණයට එරෙහි වෘත්තීය සමිති හා සිවිල් සමාජ සංධානයක් වන අපි අකටයුතුනාදකයින් හෙවත් දූෂණ හා අක්‍රමිකතාවන් පිළිබඳ තොරතුරු හෙළිකරන්නන්ගේ ආරක්ෂාව සඳහා නිතීමය

ප්‍රතිපාදනයන් ගෙන ඒමට මූලික පියවරක් ලෙස සහ ආයතනක මට්ටමින් දූෂණයට එරෙහිව කටයුතු කිරීම හා ඊට ඇති කැපවීම විදහාදැක්වීම දිරිමත් කිරීම සඳහා පළමු අදියර වශයෙන් මෙරට රාජ්‍ය අංශයේ විෂමාචාරයන්ට එරෙහිව විනය පාලනය කිරීමේ ප්‍රධාන පාර්ශවකරු වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ අනෙකුත් පාර්ශවකරුවන් වන පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභා සහ ස්වාධීන කොමිෂන් සභා සහ මණ්ඩල සමග එක්ව මෙම දූෂණ තොරතුරු හෙළිකරන්නන් (අකටයුතු නාදකයින්) උනන්දු කරවීම සහ ඔවුන්ගේ ආරක්ෂාව සඳහා වන පොදු ප්‍රතිපත්ති මාලාව සියලුම රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පළාත් රාජ්‍ය අංශයන්හි අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ආයතන වෙත ඉදිරිපත් කර සිටින අතර රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශ වෙතද මෙම ප්‍රතිපත්තිය ඉදිරිපත් කරමින් දූෂණය අවම කිරීමෙහිලා ඔවුනට ඇති කැපවීම සහතික කිරීමට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටිමු.

**ප්‍රතිපත්තිය පිළිගැනීම**

1. මෙම අකටයුතුනාදකයින් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය පිළිගන්නා සියලු රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශවල සියලු ආයතන අධ්‍යක්ෂක මණ්ඩල, භාරකාර මණ්ඩල හා ආයතන ප්‍රධානින් විසින්

- සිය ආයතනයන් හි සිදුවන විවිධ දූෂණ, අක්‍රමිකතාවන් හෝ වැරදි ක්‍රියාවන් පිළිබඳ තොරතුරු හෙළිකිරීම සඳහා තම ආයතන තුළම පුද්ගලයින් උනන්දු කරවීම
- එලෙස දූෂණ, අක්‍රමිකතාවන් හෝ වැරදි ක්‍රියාවන් පිළිබඳ තොරතුරු හෙළිකරන්නන්ට එරෙහිව සිදුවිය හැකි කවර ආකාරයක හෝ පළිගැනීම් වලක්වා ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීම
- එමෙන්ම, එසේ කටයුතු කිරීම හේතුවෙන් මුහුණ පෑ හැකි විවිධ ආර්ථිකමය හෝ ආර්ථික නොවන හානි පූර්ණය කිරීම සහතික කිරීම
- දූෂණ, අක්‍රමිකතාවන් හෝ වැරදි ක්‍රියාවන් වාර්තා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම
- ආයතන තුළ සිදුවන්නාවූ දූෂණ, අක්‍රමිකතාවන් හෝ වැරදි ක්‍රියාවන් පාලනය මගින් කාර්යක්ෂමතාව, ලාභය හා තිරසාර බව ඉහළ නැංවීම මගින් පොදු ජන යහපත සාක්ෂාත් කිරීම
- හෙළිකරන ලද්දාවූ දූෂණ, අක්‍රමිකතාවන් හෝ වැරදි ක්‍රියාවන් සම්බන්ධයෙන් නිශ්චිත කාලයක් තුළ අවශ්‍ය පියවර ගැනීම සහතික කිරීම
- අදාල දූෂණ, අක්‍රමිකතාවන් හෝ වැරදි ක්‍රියාවන් සම්බන්ධයෙන් ආයතන තුළ සිදුකළ හැකි අභ්‍යන්තර විගණනයන් මගින් නිරීක්ෂණ ලබා දීමෙන් ඔබ්බට ගොස් නිර්දේශ ලබාදීම දක්වා අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම

- විමර්ශන නිලධාරින්ගේ කාර්යභාරය ශක්තිමත් කිරීම

යන අරමුණු ඉටුකර ගැනීම උදෙසා සිය කැපවීම තහවුරු කළ යුතුය.

2. මෙම අකටයුතු නාදකයින් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය පිළිගෙන ක්‍රියාත්මක කිරීමට බැඳෙන සෑම රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හෝ පෞද්ගලික ආයතනයන් හි ලේකම්වරුන්, කළමනාකරුවන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, අධ්‍යක්ෂකවරුන්, මාණ්ඩලික නිලධාරීන්, ආයතන ප්‍රධානින්, නිලධාරීන්, සේවකයින්, කොන්ත්‍රාත්කරුවන්, ස්වේච්ඡා සේවකයින්, පුහුණුවන්නන්, සීමාවාසිකයින් ආදී සෑම අයෙකුම මෙම ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීමට බැඳෙනු ඇත.

මෙම අකටයුතු නාදකයින් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය ආයතනයක සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ඇති වන අන්‍යෝන්‍ය ගරු කිරීමට බැඳෙන ගිවිසුමක් මෙන්ම එම ආයතනයේ පරිපාලන නියමයන්ගේ කොටසක් ද විය යුත්තේය.

## අකටයුතුනාදකයෙක් වීම සේවක වගකීමක් බව

3. ඉහත සඳහන් කළ රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හෝ පෞද්ගලික ආයතනයන්හි ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, අධ්‍යක්ෂකවරුන්, කළමනාකරුවන්, මාණ්ඩලික නිලධාරීන්, ආයතන ප්‍රධානින්, නිලධාරීන්, සේවකයින්, කොන්ත්‍රාත්කරුවන්, ස්වේච්ඡා සේවකයින් පුහුණුවන්නන්, සීමාවාසිකයින් ඇතුලු සෑම පුද්ගලයකුම තම ආයතනයන්හි පාලනය හා මෙහෙයුම්වලට හෝ මූල්‍ය පරිපාලනයට අදාල වන්නාවූ නීති රෙගුලාසි හෝ විධිවිධාන නැතහොත් එය රජයේ ආයතනයක් නම් ආයතන සංග්‍රහය, මූල්‍ය රෙගුලාසි සහ රාජ්‍ය නොවන හෝ පෞද්ගලික අංශයේ ආයතනයක් නම් එම ආයතනයන්හි ව්‍යවස්ථාවන්, මූල්‍ය හා පරිපාලන විධිවිධානයන් හෝ මෙම සියලුම ආයතන සම්බන්ධයෙන් වන කල්හි අනෙකුත් පොදු නීතියක් උල්ලංඝනය කරන බවට හෝ මහජන පොදු යහපතට හානිකර අකටයුත්තක් සිදුවන බවට දැනීමක් හෝ සැකයක් ඇත්නම් එය සිය ආයතනය විසින් පත්කර ඇති **අනුකූලතා නිලධාරියා** වෙත වාර්තා කිරීම වගකීම වන්නේය. අනුකූලතා නිලධාරියකු වෙත තොරතුරක් ලබා දීම කිසිදු විටක ආයතනය සම්බන්ධයෙන් තමන්ට ඇති වගකීම් උල්ලංඝනය කිරීමක් නොවන්නේය.

## රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය අංශයේ අනුකූලතා නිලධාරියාට තොරතුරු හෙළිකළ නොහැකි අවස්ථාවක තත්ත්වය

**4.** රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පලාත් රාජ්‍ය අංශයේ ආයතනයක් හෝ සම්බන්ධයෙන් වන විට එකී අකටයුත්ත සිදුකරන්නා හෝ ඊට සම්බන්ධ පාර්ශවයක් හෝ ඉහත අනුකූලතා නිලධාරියා හෝ

ආයතන ප්‍රධානියාම වන විටක එම තොරතුර මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීමේ බලධාරියා බවට අවස්ථාවෝචිත පරිදි පත්වන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අදාල පළාත් රාජ්‍ය සේවා කොමිසම හෝ ආයතන සංග්‍රහය අදාල නොවන්නාවූ ආයතන සම්බන්ධයෙන් වන විට ඒ ඒ ආයතනයන් සඳහා අදාල වන්නාවූ පරිපාලන මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය. අනුකූලතා නිලධාරියා අදාල අකටයුත්ත සිදු කරන්නා හෝ ආයතන ප්‍රධානියා හෝ වන විටක එම තොරතුරු හෙළිකිරීම අවස්ථාවෝචිත පරිදි සිදුකිරීම මෙම ප්‍රතිපත්තියේ ආරක්ෂාවෙන් ආවරණය විය යුතුය.

**රාජ්‍ය නොවන හෝ පෞද්ගලික අංශයේ අනුකූලතා නිලධාරියාට තොරතුරු හෙළිකළ නොහැකි අවස්ථාවක තත්ත්වය**

**5.** රාජ්‍ය නොවන හෝ පෞද්ගලික අංශයේ ආයතනයක් සම්බන්ධයෙන් වන විට එකී උල්ලංඝනය කිරීම සිදුකරන්නා හෝ ඊට සම්බන්ධ පාර්ශවයක් හෝ ඉහත තොරතුරු වාර්තා කිරීමට පත්කර අනුකූලතා නිලධාරියා ආයතන ප්‍රධානියාම වන විටක එකී තොරතුරු අධ්‍යක්ෂක මණ්ඩල ප්‍රධානියාට හෝ නම් කළ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකුට හෝ අදාල ආයතනයේ කටයුතු සම්බන්ද නිසි නෛතික බලය හිමි ආයතනයකට අදාල තොරතුරු හෙළිකිරීම මෙම ප්‍රතිපත්තියේ ආරක්ෂාවෙන් ආවරණය විය යුතුය.

**අකටයුතු නාදකයකු කිසිදු පළිගැනීමකට ලක් නොවිය යුතු බව**

6. රාජ්‍ය ආයතනයක, අර්ධ රාජ්‍ය ආයතනයක රාජ්‍ය නොවන ආයතනයක හෝ පෞද්ගලික ආයතනයක සිදු වන නීති විරෝධී හෝ විනය විරෝධි හෝ මහජන පොදු යහපතට හානිකර ක්‍රියාවක් දැනුම්දෙන පුද්ගලයකු එකී දැනුම් දීම හේතුවෙන් කිසිදු ඍජු හෝ වක්‍ර පළිගැනීමකට හෝ හිංසනයකට හෝ විනය පරීක්ෂණයකට, සේවා තහනමකට, සේවා අවසන් කිරීමකට, ස්ථාන මාරුවකට, සේවා තත්ත්වයෙන් පහළ දැමීමකට ලක් නොවිය යුතුය.

**ප්‍රතිපත්තියේ ආරක්ෂාව හිමිවීම**

7. කිසියම් පුද්ගලයෙකු හිතා මතාම ආයතනයේ නිලධාරියකු හෝ ප්‍රතිපත්තියක් අප්‍රසාදයට පත්කිරීමේ අරමුණින් තොරව හෝ පෞද්ගලික ලාභයක් සඳහා තාවකාලික රැවටීමක් කිරීමේ අරමුණින් තොරව, සත්භාවයෙන් සත්‍ය බවට සාධාරණ ලෙස විශ්වාස කරමින්, තොරතුරු හෙළිකරන සෑම අවස්ථාවක ඉහත 6 වන ප්‍රතිපත්තියේ ආරක්ෂාව හිමි විය යුතුය.

**ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඊට දිරිගැන්වීම**

8. මෙම ප්‍රතිපත්තිය අනුමතකර ක්‍රියාත්මක කිරීමට එකග වන්නාවූ සෑම ආයතනයකම ප්‍රධානීන් හා විධායක සභාවන් තම සේවකයන් බඳවා ගන්නා අවස්ථාවේදීම සහ දැනටමත් ආයතනයේ

සේවයේ නිරත සේවකයන් සම්බන්ධයෙන්, මෙම ප්‍රතිපත්තියට එකගතාව ලබා දී පළමු මස ඇතුලතම අකටයුතු නාදනය සඳහා සිය සේවකයින් උනන්දු කරවීමට හා මෙම ප්‍රතිපත්තියෙන් ලැබෙන ආරක්ෂාව පිළිබඳ දැනුම්වත් කිරීමට පියවර ගත යුතුය.

9. ආයතනයේ යම් සේවකයකු හෝ කවර ආකාරයකින් හෝ ආයතනයේ කටයුතු වලට සම්බන්ධ අයෙකු අකටයුතු නාදනය හේතුවෙන් පළිගැනීමකට ලක්ව ඇත්නම් හා ඒ සම්බන්ධව පැමිණිල්ලක් ලැබී ඇත්නම් අදාල පැමිණිල්ල ලැබී ඇති ආයතනය හෝ පරීක්ෂණ මණ්ඩලය හෝ විසින් එයට ප්‍රමුඛත්වය ලබා දී විමර්ශනය කළ යුතු අතර පළිගැනීමකට ලක්ව ඇති බව තහවුරු වේ නම් ලබාදිය හැකි සියලු සහන ලබා දීම හා මූල්‍ය හානියක් වේ නම් එය ප්‍රතිපූරණය කළ යුතුය.

එසේ තොරතුරු හෙළිකිරීමකට එරෙහිව පළිගැනීම සිදුකරන නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වීම, සේවා තහනම් පැනවීම හා සේවා අවසන් කිරීම දක්වා දඩුවම් නියම කිරීම අදාළ ආයතනයේ ප්‍රධානි හෝ අධ්‍යක්ෂක මණ්ඩලයේ හෝ විනය මණ්ඩලවල වගකීම වන්නේය.

## අනුකූලතා නිලධාරියකු පත්කිරීම

10. මෙම ප්‍රතිපත්තිය අනුමතකර ක්‍රියාත්මක කිරීමට එකග වන්නාවූ සෑම ආයතනයක්ම අකටයුතු නාදකයින්ට නීති විරෝධී හෝ විනය විරෝධි හෝ මහජන පොදු යහපතට හානිකර ක්‍රියාවක් පිළිබඳ තොරතුරු දැනුම්දීම සඳහා සේවා ආයතනය තුළම නිසි බලය සහිත **අනුකූලතා නිලධාරියකු** නම් කළ යුතුය. අදාල අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වරයකු සෑම විටම **අනුකූලතා නිලධාරියකු** ලෙස පත් කළයුතු අතර එම පැමිණිළි නිලධාරියා අකටයුතු නාදකයකු හෙළිකළ තොරතුරක් සම්බන්ධව ක්‍රියාත්මක වීමේදී ආයතන ප්‍රධානියාගේ බලපෑමෙන් නිදහස් විය යුතුය.

## අකටයුතුනාදකයන්ගේ අනන්‍යතාවය හෙළි නොකළ යුතුබව

11. **අනුකූලතා නිලධාරියකු** තමන් වෙත ලැබෙන නීති විරෝධී හෝ විනය විරෝධි හෝ මහජන පොදු යහපතට හානිකර ක්‍රියාවක් පිළිබඳ පැමිණිල්ලක අනන්‍යතාවය හෙළි නොකළ යුතුය. එවන් පැමිණිල්ලක් ලැබුණු වහාම එහි පරීක්ෂණයක් සිදුකළ යුතු කරුණු ඇතුලත් වේ නම් ඒ සඳහා ආයතනයේ පිහිටුවා ඇති විශේෂ විමර්ශන අංශයකට හෝ අභ්‍යන්තර විගණන අංශයට හෝ යොමු කිරීම ඔහුගේ වගකීම වන්නේය.

ආයතනය තුළ හෝ බාහිරව හෝ යම් විමර්ශන මණ්ඩලයකට යම් පැමිණිල්ලක් යොමු කළ පසු එකී විමර්ශන මණ්ඩලය විසින් එකී පැමිණිල්ලට ගත් ක්‍රියාමාර්ග සහ පැවැත්වූ විමර්ශනයේ තොරතුරු පසු විපරම් කිරීමේ අයිතිය අනුකූලතා නිලධාරියා සතු වන්නේය.

## සත්‍ය බව තහවුරුවූ දූෂණ තොරතුරු සඳහා පියවර

12. අදාල පැමිණිල්ල විමර්ශනය කරනු ලබන විශේෂ විමර්ශන අංශය හෝ අභ්‍යන්තර විගණන අංශය හෝ විසින් අදාල අකටයුත්තේ ස්වභාවය හා සම්බන්ධ පාර්ශවයන් ආයතනයෙන් ඉවත්ව යාමට ඇති හැකියාව සලකා වහාම සිදු කරන නිසි පරීක්ෂණයකින් පසු අකටයුත්තක් සිදුවී ඇති බවට තහවුරු වන්නේනම් එකී අකටයුත්ත නිවැරදි කිරීම හා හෝ එකී වරදට වගකිවයුතු තැනැත්තන්ට දඩුවම් පැමිණවීමට අවශ්‍ය නිර්දේශ ආයතනික පරිපාලන නීතීන්ට අනුකූලව ලබා දිය යුතුය.

## පසු විපරම සඳහා අයිතිය

13. අනුකූලතා නිලධාරියා වෙත තොරතුරු හෙළි කළ පාර්ශවයහට තමන් ලබාදුන් තොරතුරට ගත් ක්‍රියාමාර්ග හා ඒ සම්බන්ධව පැවති පරීක්ෂණයන් හි තත්ත්වය පිළිබද තොරතුරු අනුකූලතා නිලධාරියා වෙතින් ලබාගැනීම සඳහා අයිතිය ඇත්තේය.

## අකටයුතු නාදකයකුට අභියාචනය කිරීමට ඇති අවසරය

14. විශේෂ විමර්ශන අංශය හෝ අභ්‍යන්තර විගණන අංශය විසින් ලබා දෙන්නාවූ නිර්දේශයක් ක්‍රියාක්මක කිරීමට වගකීම දරන නිලධාරියා හෝ ආයතනයේ පාලක සභාව පැහැර හරින අවස්ථාවක හෝ පැමිණිලි නිලධාරියා වෙත සත්‍ය බවට සත්භාවයෙන් විශ්වාස කරමින් හෙළි කරන තොරතුරක් පරීක්ෂණයකට යොමු නොකරන අවස්ථාවක හෝ පළිගැනීමකට ලක් වූ අකටයුතු නාදකයකුට සහනයක් නොලැබුනු අවස්ථාවක හෝ ඊට එරෙහිව මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ බලධාරියා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අදාල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එකී ආයතනය අයත්වන්නාවූ ස්වාධීන කොමිෂන් සභාව සහ මණ්ඩලය වෙත අකටයුතු නාදකයකුට අභියාචනය කිරීමට අයිතිය ඇති අතර එවන් අභියාචනයකට ප්‍රමුඛතාවය දී විමර්ශනය කිරීම අදාල අභියාචක ආයතනයේ යුතුකම වන්නේය.

15 අකටයුතුනාදකයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් හා මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බල අධිකාරයක් පිහිට වූ අවස්ථාවක ඉහත කී අභියාචක බලය එකී නිසි බලය සහිත අධිකාරය වෙත හිමි වන්නේය.